**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

SRI LANKA
IMMIGRATION AND EMIGRATION

# ලංසු ආරාධනය

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සඳහා ආරක්ෂක සේවා සැපයීම**
**කොන්ත්‍රාත් අංකය: DIE/PRO/03/2024/01**

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත කාර්යාල සඳහා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.
2.

| |
|---|
| 1. ප්‍රධාන කාර්යාලය “සුහුරුපාය” ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල. |
| 2. ත්‍රිකුණාමලය වරායේ නිලධාරී විවේකාගාරය |
| 3. කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල විවේකාගාරය |
| 4. හම්බන්තොට වරාය නිලධාරී විවේකාගාරය |
| 5. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපල විවේකාගාරය |
| 6. මහනුවර ප්‍රාදේශීය කාර්යාලය |
| 7. වව්නියාව ප්‍රාදේශීය කාර්යාලය |
| 8. කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය |
| 9. මාතර ප්‍රාදේශීය කාර්යාලය |
| 10. මිරිහාන රැඳවුම් මධ්‍යස්ථානය |
| 11. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල විවේකාගාරය |

3. මෙම ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර බත්තරමුල්ල, ශ්‍රී සුභූතිපුර පාරේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ 5 වන මහලේ “බී” පර්යන්තයේ ප්‍රසම්පාදන අංශයේ නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැකි අතර එම ලිපිනයේදීම ලංසු ලිපිලේඛන පරීක්ෂාව 2024.02.22 දින සිට 2024.03.13 දින දක්වා ඕනෑම වැඩ කරන දිනයක දී පෙ.ව. 9.00 සිට පස්වරු 3.00 දක්වා සිදු කළ හැක.

ඇමතුම් අංක : දුරකථන 011-2101559 ෆැක්ස් අංක - 011-2879091

5. රුපියල් පන්දහස් පන්සියයක (රු.5500.00) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, B පර්යන්තය, 5 වෙනි මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, “සුහුරුපාය”, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 2024.02.22 දින සිට 2024.03.13 දක්වා කාල පරිච්ඡේදයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මුද්‍රිත සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් මිල දී ගත හැක.

6. සම්පූර්ණ කරන ලද ලංසු, “මුල් පිටපත” (Original) හා “අනුපිටපත“ (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන අංශය, B පර්යන්තය, 5 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, සුහුරුපාය, ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල යන ලිපිනයට 2024.03.14 වැනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ හැක. ලංසු කැඳවීම අවසන් වූ වහාම ඉහත දක්වා ඇති ලිපිනයේ දී පැමිණීම සඳහා කැමත්ත දක්වන

ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී ලංසු විවෘත කරන ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගන්නා අතර එම ලංසු විවෘත නොකර ආපසු භාරදීම සිදු කරනු ලැබේ.

7. ලංසුකරු විසින් භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින 105 කාල සීමාවකට හෝ ඕනෑම දිගුකරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය.

8. සියලුම ලංසු, ලංසු ලේඛනයේ 3.3හි දක්වා ඇති ආකෘතියේ පරිදි ලංසු සුරක්ෂණයක් සමඟ ආගමන හා විගමන පාලක ජනරාල් වෙත (ලිපිනයට) එවිය යුතු අතර ලංසු සුරක්ෂණය රු. 400,000.00 ක වටිනාකමකින් යුතු 2024.06.27 දින තෙක් වලංගු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් නිකුත් කරන ලද්දක් විය යුතුය.

9. පූර්ව ලංසු රැස්වීම 2024.03.05 වැනි දින ප.ව. 2.00 ට “සුහුරුපායෙහි” 5 වන මහලෙහි පිහිටි ආගමන හා විගමන පාලක ජනරාල් කාර්යාලයේ දී පැවැත්වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**“සුහුරුපාය”, ශ්‍රී සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල.**